සුවෙන් පෙරට

ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
Zonal Education Office - Minuwangoda

වාරය - II

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : 11 | විෂයය : සිංහල සාහිත්‍ය රසාස්වාදය | පාඩම : 16 පාඩම වැස්ස |

## ගුණදාස අමරසේකර



| | |
|---|---|
| උපත | 1929<br>යටලමත්ත, ගාල්ල, ශ්‍රී ලංකාව |
| ජාතිකත්වය | සිංහල |
| අධ්‍යාපනය | යටලමත්ත ක.වි<br>නාලන්දා විද්‍යාලය, කොළඹ,<br>මහින්ද විද්‍යාලය, ගාල්ල |
| රැකියාව | දන්ත වෛද්‍ය |

ආචාර්ය ගුණදාස සූරියආරච්චි අමරසේකර ලංකාවෙන් බිහිවූ විශිෂ්ට සිංහල

නවකතාකරුවෙකි; කෙටිකතාකරුවෙකි; කවියෙකි; විචාරකයෙකි; චින්තකයෙකි.

# කෘතීන්

## නවකතා

- ධාතුසේන
- කරුමක්කාරයෝ
- යළි උපන්නෙමි
- දෙපා නොලද්දෝ
- ගන්ධබ්බ ආපදානය
- අසත්‍ය කථාවක්

## කෙටිකතා

- රතු රෝස මල(1953)
- ජීවන සුවඳ(1960)
- එක ම කථාව(1969)
- එක්ටැමෙන් පොළවට
- කථා පහක්
- ගල් පිළිමය සහ බොල් පිළිමය
- මරණ මංචකයේ දුටු සිහිනය
- පිළිම ලොවයි පියවි ලොවයි
- විල් තෙර මරණය
- කවන්ධයක කතන්දරය?
- කියනු මැන දිවි අරුත

## පද්‍ය

- භාව ගීත (1955)
- උයනක හිඳ ලියූ කවි (1957)
- අමල්බිසෝ
- ගුරුළු වත
- ආවර්ජනා
- අසක් දා කව

- **පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. වැස්ස පද්‍ය පන්තිය රචනා කළේ කවුරුන්ද?
2. මෙතුමා කුමන වෘතිකයෙක්ද?
3. කවියා දක්ෂතා දැක් වූ අංශ 3ක් නම් කරන්න.
4. නූතන කවියට මෙතුමාගෙන් සිදු වූ විශේෂ සිදුවීම් කුමක්ද?
5. මෙහි සඳහන් අර්ථාලංකාර 2ක් උදාහරණය බැගින් දෙමින් ලියන්න.
6. ඔහු විසින් රචනා කර ඇති පද්‍ය ග්‍රන්ථ 6ක් නම්කරන්න.
7. මෙයින් කියවෙන ජීවන දෘෂ්ටිය කුමක්ද?
8. මෙහි සඳහන් කාව්‍ය ආකෘතිය කුමක්ද?

## 2. රසාස්වාද ප්‍රශ්නයය ( 2020 O/L)

❖ පහත දී ඇති පැදි පෙළ කියව අසා ඇති ප්‍රශ්න උපයෝගී කර ගනිමින් රසාස්වාදයක් ලියන්න. (උපුටාගැනීම් 3ක් ලියන්න)

විච්රි විරි විච්රි විරි උදේ සිට ඇද හැලෙන
පොද නොකැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොලන
පාර තොට ගහ කොළ ද වසාගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහරු මඩ ඇඟිලි කරු අතර විරි විරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුන
අළුත් පස් දැමූ පාර දනිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

තෙමුන රෙදි ඇඟ ඇලුණ හබුරු කොළ මලීපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැඳුන
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව

වහින වැහි තද සුළඟ නො පායන මුළු දවස
ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක් කෙරෙන
කාර් රෝදයෙන් විරිස් ඇඟ පුර මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දාම හිස කෙස් ද
අලුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇදෙහි ඉඳ උණුහුමට බොන්නේ කොයි මොහොතෙදැයි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ලත වේ ය

1. මෙම පදය පන්තිය ට පාදක වූ අද්දැකීම පැහැදිලි කරන්න
2. මෙම අද්දැකීම රසවත් ලෙස ඉදිරිපත් කිරීම සඳහා කවිය තොරා ගත් අවස්ථා හා සිද්ධි කවරේ දැයි විස්තර කරන්න
3. කවියා වැස්ස කෙරෙහි කුමන ආකල්පයක් දරනේ දැයි පැහැදිලි කරන්න
4. මෙම පදය පන්තියේ සාර්ථකත්වය සඳහා කවියා යොදා ගත් භාෂාව ඉවහල් වී ඇති අකාරය විමර්ශනයට ලක් කරන්න
5. කවියා යොදාගත් ආකෘතිය පද්‍යා පන්තියේ සාර්ථක බව සඳහා හේතු වී තිබේද විමසන්න.

(සැ.යු. එක් කොටසකට උපුටාගැනීම් 3 බැගින් ලියන්න



## ❖ විචාර ප්‍රශ්න

1. ගුණදාස අමරසේකරයෙන් වැස්ස පදය පන්තිය සරල අනුභූතියක් පාදක කරගෙන රචනා කල ද ගැඹුරු ජීවන දෘෂ්ටියක් විවරණය කරන්නකි  මේ  පිළිබඳව ඔබේ අදහස් විචාරාත්මකව විමසන්න

2. ගුණදාස අමරසේකරයන්ගේ වැස්ස  පද්‍ය පන්තිය සාර්ථක පද්‍ය පන්තියකි විමසන්න

3. තේමාවට උචිත භාෂා භාවිතය මෙම කවි පෙළහි විශේෂත්වයකි  නිදසුන් සහිතව පහදන්න

**(සැ.යු.   උපුටාගැනීම් 5ක් ලියන්න )**

අනුෂා නිශාන්ති ගමගේ මිය
බප/මීණු/ බණ්ඩාරනායක මහා විද්‍යාලය
මීරිගම